**<u>සහකාර ලේකම් තනතුරු පුරප්පාඩු - රාජ්‍ය සේවා කොමිෂන් සභාව</u>**

මෙම කාර්යාලයේ පවතින සහකාර ලේකම් තනතුරු පුරප්පාඩු 03 ක් සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III/II ශ්‍රේණිවල නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ඒ අතුරින් පහත සඳහන් විශේෂ සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් සඳහා **ප්‍රමුඛතාවය** දෙනු ලැබේ.

I. මූලික උපාධියේ ප්‍රධාන විෂයය ලෙස සිංහල භාෂාව සහ අනෙක් විෂයයන් යටතේ සිංහල සංස්කෘත හදාරා තිබීම

**හෝ**

ii. මූලික උපාධියේ ප්‍රධාන විෂයය ලෙස දෙමළ භාෂාව හදාරා ඇති සිංහල භාෂාවෙන් රාජකාරි කළහැකි වීම (ලිවීම, කියවීම, කථනය හා තේරුම්ගැනීමේ මනා හැකියාවක් සහිත විය යුතුය.)

**සහ**

iii. ඉංග්‍රීසි භාෂාව සම්බන්ධයෙන් විශිෂ්ඨ දැනුමක් තිබිය යුතුය

02. ඒ අනුව අදාළ සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් තම ජීවදත්ත පත්‍රිකාවක් ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව **(මෙම කාර්යාලයේ පවත්නා ඉහත සඳහන් තනතුරු සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට සේවය කරනු ලබන ආයතනයේ සේවයෙන් මුදා හැරීමට හැකිද යන්න සඳහන් කර තිබිය යුතුය) 2023.07.20** දිනට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් යොමු කිරීමට කටයුතු කරන්න.

ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
1200/9, රජමල්වත්ත පාර
බත්තරමුල්ල

ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
2023. ජූලි මස 05 දින